# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,492 — 1965 අගෝස්තු 27 වැනි සිකුරාද — 1965.8.27**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනත**

**25 (1) වෙනි වගන්තිය යටතේ කෙරෙන නියෝගයයි**

ජනසතු සේවා අමාත්‍ය ධූරන්ධර, විතාන ආරච්චිගේ සුගතදස වන මම, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූ ද, ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනා කර ඇත්තාවූද, නිශ්චල දේපල අත්කර ගැනීම 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මෙයින් අනුමත කරමි.

වී. ඒ. සුගතදස,
ජනසතු සේවා ඇමති.

1965ක්වූ අගෝස්තු මස 21 වෙනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ, රත්නපුර නගරසභා සීමාවන් තුළ, ගොඩිගමුව නම් ගමේ පිහිටි දළ වශයෙන් අ. 0, රූ. 2, ප. 0ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කැබැල්ලක් :—

2. උතුරට : කෞතුකාගාර භූමිය ;
   නැගෙනහිරට හා දකුණට : පෞද්ගලික පාරක්.
   බස්නාහිරට : පාරක්.

3. අත්කර ගැනීමට ඇත්තාවූ ඉඩම් කැබැල්ලේ විස්තර මෙසේය :—
   ඉඩමේ නම : දඹවින්න වලව්ව (කොටසක්)..
   වගාව : මුඩු බිම.
   ප්‍රමාණය : දළ වශයෙන් අ. 0, රූ: 2, ප. 0ක් පමණ.
   අයිතිවාසිකම කියන්නාගේ නම සහ ලිපිනය : ධර්මදස එල්ලාවල, රාජකීය ලංකා ගුවන් හමුදාව.

8–1117

---

## මිළ පාලන දැන්වීම්

**සී 490 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය** **කිරි ආහාර**

**මිළ පාලන පනත**

**නියෝගය**

මිල පාලක (ආහාර) තැන්පත් පින්නදූවගේ ආතර් සිල්වා වන මම, (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිල පාලක (ආහාර) වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ නිශ්චිතව විස්තර කරන ලද කිරි ආහාර වර්ගය තොග වශයෙන් විකිණීමේ දී ටින් දුසිම එකක්ද, සිල්ලර වශයෙන් විකිණීමේ දී ටින් එකක් ද, ශ්‍රී ලංකාද්වීපය ඇතුළත විකිණිය හැකි උපරිම මිළ දැන් පටන් මේ උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(2) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට ටින් දුසිමක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයක් පාරිභෝග්‍ය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ටින් දුසිමකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

1277——ආර් 8301—7,200 (8/65)

(3) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(4) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(5) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා." යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද "අවුන්ස" යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත අවුන්සයේ බර ප්‍රමාණය බව ද නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන් සෑම තැනැත්තකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු ද විසින් ම මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ටින් ගණන හා එක ටින් එකක ශුද්ධ බර ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම් වෙළෙඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක්

මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(7) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ යම් භාජනයක බහාලනු ලැබේ නම් එම එතුම් කොලයේ හෝ භාජනයේ මිලත් උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල සඳහන් උපරිම මිළ ගණන්වලට ඇතුළත් වියයුතු බවද නියම කරමි.

1965 අගෝස්තු 26 වෙනි දින පස්වරු 3ට කොළඹ දී අත්සන් කරණ ලදී.

පී. ඒ. සිල්වා,
මිල පාලක (ආහාර).

## උපලේඛනය

| 1 වන තීරය<br>කිරි ආහාර වර්ගය | 2 වන තීරය<br>ටින් දුසිමක් විකිණිය හැකි උපරිම තොග මිල<br>රු. ශ. | 3 වන තීරය<br>ටින් එකක් විකිණිය හැකි උපරිම සිල්ලර මිල<br>රු. ශ. |
|---|---|---|
| නෙස්ප්‍රේ—රා. 1 | 35 75 | 3 10 |
| නෙස්ප්‍රේ—රා. 2½ | 86 50 | 7 45 |
| නෙස්ප්‍රේ—රා. 5 | 163 0 | 13 85 |
| එවුරිඩේ—අවුන්ස 12 | 22 67 | 2 0 |
| එවුරිඩේ—රා. 3 | 86 0 | 7 45 |
| ක්ලිම්—රා. 1 | 37 80 | 3 30 |
| ක්ලිම්—රා. 2½ | 90 75 | 7 90 |
| ක්ලිම්—රා. 5 | 170 10 | 14 85 |
| නෝමඩ්—රා. 1 | 35 50 | 3 10 |
| නෝමඩ්—රා. 2½ | 82 21 | 7 20 |
| නෝමඩ්—රා. 5 | 156 40 | 13 40 |
| ඇන්කර්—රා. 5 | 126 0 | 10 75 |
| පර්න්ලිප්—රා. 2½ | 72 0 | 6 30 |
| පර්න්ලිප්—රා. 5 | 138 0 | 12 0 |
| කවුඇන්ඩ්ගේට්—(රෙඩ් කවු) රා. 2½ | 72 0 | 6 25 |
| විටාස්ප්‍රේ—රා. 1 | 32 85 | 2 80 |
| විටාස්ප්‍රේ—රා. 2½ | 75 50 | 6 50 |
| විටාස්ප්‍රේ—රා. 5 | 148 0 | 12 75 |

සැලකිය යුතුයි.—මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිල නොවේ. මෙහි ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිල ගණන්ය. එම මිල ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකි ය.

8——1116

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි